**ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය - 2022**

**---------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයින් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය හා කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශන වල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;
- යම් අදාල ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව.
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාල නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්හි ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.189,217,447 ක් වූ වත්කම් 2022 දෙසැම්බර් 31 දිනට තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | කාර්යමණ්ඩලය සීමා සහිත වීම නිසා පියවර කිහිපයක් යටතේ ප්‍රත්‍යාගණන ක්‍රියාවලිය සිදු කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව ගොඩනැගිලි සහ විද්‍යාගාර උපකරණ ප්‍රත්‍යාගණනය කර අවසන් වී ඇති අතර අනෙකුත් වත්කම් ප්‍රත්‍යාගණන කටයුතු 2023 වර්ෂයේ දී නිම කිරීමට බලාපොරත්තු වන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුලදී ලැබී තිබූ රු.2,173,401 ක ප්‍රාග්ධන ප්‍රදාන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 අනුව මූල්‍ය ප්‍රකාශන තුල හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | විශ්වවිද්‍යාලයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 2.19.2 ට අනුව රු.216,067,868 ක් 2022 වර්ෂයේ හුවමාරු නොවන ආදායම් ලෙස ද රු.2,173,402 ක් වර්ෂ අවසානයේ ප්‍රාග්ධන අත්තිකාරම් ලෙස දක්වන ලදි. මෙය ගිණුම්කරණ ප්‍රමිත සමඟ ඉදිරියේ දී සසඳා බැලීමට එකඟ වන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | -------------------------------- | ----------- |
| (අ) | උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD) මගින් සමාලෝචිත වර්ෂය තුලදී මිලදීගෙන තිබුණු එකතුව රු. 20,528,699 ක් වූ වත්කම් ගිණුම්වලින් අත්හැරී තිබුණි. | මෙම ව්‍යාපෘතිය මඟින් 2022.11.01 දින සිට 2022.12.31 දින දක්වා මිලදී ගත් වත්කම් හඳුනා ගැනීම, සත්‍යාපනය සහ මූල්‍ය කමිටුව හරහා පාලක සභාවේ අනුමැතිය ලබා ගැනීම යන කාරණා 2022 වර්ෂය තුලදීම සිදු කිරීම ප්‍රායෝගික නොවූ නිසා එම වත්කම් 2023 වර්ෂයේ දී විශ්වවිද්‍යාලය වෙත භාරදීමට තීරණය කරන ලද බව. | එක් එක් වර්ෂයන් තුලදී මිලදී ගත් වත්කම් එම වර්ෂයට අදාලව ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 වර්ෂයට අදාලව ආරක්ෂක සේවා ලබාගැනීම වෙනුවෙන් ගෙවිය යුතු රු.4,312,139 ක් පෙර වර්ෂයේ ලාභයට ගැලපීම් කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | වර්ෂයට අදාල වියදම නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන තුල ගැලපීම් කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් වලට අදාලව සමුච්චිත ක්ෂය ගැලපීමේදී ක්ෂය වෙන්කිරීමේ ගිණුමෙන් රු.3,321,744 ක් වැඩියෙන් ඉවත් කිරීම හේතුවෙන් ප්‍රත්‍යාගණන සංචිතය හා සමුච්චිත ක්ෂය එම වටිනාකමෙන් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | වත්කම් ප්‍රත්‍යාගණන ක්‍රියාවලියේ දී විද්‍යාගාර උපකරණ ගිණුම් තුළ පිරිවැය රු.38,356,778 ක් වූ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය හඳුනා ගන්නා ලදි. එම වත්කම් වලට අදාල ශුද්ධ අගය රු.559,012 ක් වූ අතර එම ගිණුම්කරණ දෝෂය නිවැරදි කර ඇති බැවින් වර්ෂයේ අලාභයට කිසිඳු බලපෑමක් සිදු නොවේ. | අදාල ක්ෂය වටිනාකම අනුව ප්‍රත්‍යාගණන ලාභය නිවැරදිව හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | බැඳුම්කර ගිවිසුම් කඩ කිරීම හේතුවෙන් කථිකාචාර්යවරුන් තිදෙනෙකුගෙන් 2022 දෙසැම්බර් 31 දිනට අයකර | කථිකාචාර්යවරුන් දෙනෙකුගෙන් අයකරගත යුතු රු.3,231,845 ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් ස්ථිර වශයෙන්ම | බැඳුම්කර ගිවිසුම් කඩ කිරීමට අදාළව අයකර ගත යුතු මුළු වටිනාකම මූල්‍ය |

| | | |
|---|---|---|
| ගතයුතු එකතුව රු.10,423,394ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | අයකරගත හැකි බැවින් එය අයකරගත යුතු මුදල් යටතේ දක්වා නොමැති බව. ආචාර්ය උපාධි සහතිකය ඉදිරිපත් නොකළ කථිකාචාර්යවරයාගෙන් රු.7,191,549 ක් අයකර ගත යුතු බවට විශ්වවිද්‍යාල පාලක සභාව තීරණය කර ඇතත් ඒ සම්බන්ධ නීතිමය ප්‍රතිපාදන නීතිපතිගෙන් විමසා ඇති බව. එම උපදෙස් ලැබෙන තුරු බැඳුම්කර ගිවිසුම් කඩකළ ආචාර්යවරයකු ලෙස හෙළිදරව් කර නොමැති බව. | ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | විවිධ ඉදිකිරීම්, සැපයුම් හා සේවා ලබා ගැනීමේදී අතුරුදවුම් වශයෙන් රඳවාගෙන තිබුණු වර්ෂ 02 ක් ඉක්ම වූ එකතුව රු.49,950,980කට අදාල තැන්පතු 49 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | එකතුව රු.19,854,646ක් අවසන් බිල්පත්‍ර ගෙවූ පසු හා වගකීම් කාලය ඉකුත් වීමෙන් පසු නිදහස් කරන බව. එකතුව රු.4,196,333ක අතුරුදවුම් මේ වනවිට නිදහස් කරමින් පවතින බව<br><br>එකතුව රු.25,900,000ක අතුරුදවුම් නිදහස් කිරීමට හෝ රාජ්‍ය ආදායමට ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහය
---------------------

| | | | | |
|---|---|---|---|---|
| (i) | XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය සහ 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | අධ්‍යයන කාර්යය මණ්ඩලයේ 184 දෙනෙකුගේ පැමිණීම තහවුරු කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී වැටුප් හා දීමනා ලෙස එකතුව රු.742,937,739 ක් ගෙවා තිබුණි. | සෑම මසකම අවසානයේ දී වැටුප් අංශය මඟින් අදාල ප්‍රධානීන්ගෙන් නිලධාරීන් සේවයේ නියුක්ත බවට තහවුරුවක් වැටුප් ගෙවීමට පෙර ලබා ගන්නා බව. | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | V පරිච්ඡේදයේ 7.6 වගන්තිය | 2022 දෙසැම්බර් 31 දින වන විට බැඳුම්කර ගිවිසුම් කඩකිරීම හේතුවෙන් ආචාර්යවරුන් 12 දෙනෙකුගෙන් අයවිය යුතු රු.110,016,322ක් අයකරගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | බැඳුම්කර ගිවිසුම් කඩ කිරීම වෙනුවෙන් එක් එක් නිලධාරියාගෙන් අයවිය යුතු මුදල් විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදලින් හා ඉතිරිය වාරික වශයෙන් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | විදේශ ප්‍රදාන මත ක්‍රියාත්මක ව්‍යාපෘති 08 ක් සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කිරීමකින් තොරව ව්‍යාපෘති 06 ක් සඳහා 2022 වර්ෂය තුළදී රු.16,137,996 ක් ලබාගෙන තිබුණි. | විදේශ ප්‍රදාන මත ක්‍රියාත්මක ව්‍යාපෘති 08 සම්බන්ධයෙන් 2023 අප්‍රේල් 19 දිනැති ලිපිය මඟින් මහා භාණ්ඩාගාරය දැනුවත් කළ බව. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2019 නොවැම්බර් 25 දිනැති අංක 09/2019 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව නිල නිවාස කුලී අයකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා පමණක් උපකුලපතිවරයා ඇතුළු නිලධාරීන් 53 | 2018 වර්ෂය පමණ වන තෙක් විශ්වවිද්‍යාලයේ පැවති අධ්‍යයන හා අනධ්‍යයන සේවක පුරප්පාඩු හේතුවෙන් මෙම අංශවල | අදාළ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | දෙනෙකුගෙන් එකතුව රු.4,847,532 ක් වූ නිල නිවාස කුලී අඩුවෙන් අයකර තිබුණි | සංවර්ධනයක් සිදු කිරීම සඳහා නිවාස මණ්ඩලයේ නිර්දේශ හා පාලක සභාවේ අනුමැතිය මත නේවාසිකාගාර /කාර්යමණ්ඩල පහසුකම් සැපයූ බව | |
| (ඉ) | 2009 සැප්තැම්බර් 01 දිනැති අංක DMA/2009(2) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.869,829,650 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙනගොස් නොතිබුණි. | 2016 වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ මූල්‍ය අංශය විසින් පොදු ලෙජරය වැටුප් සැකසුම, තොග සහ ස්ථාවර වත්කම් යනාදී අංශයන්ගේ ගනුදෙනු වාර්තාකරණය සඳහා පරිගණක පද්ධති 04 ස්ථාපිත කරන ලද බව. එක් එක් කාණ්ඩයේ වත්කම් ප්‍රත්‍යාගණනය අවසන් කර ස්ථාවර වත්කම් මෘදුකාංගය යාවත්කාලීන කිරීමට තීරණය කර ඇති බව. | අදාළ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.7 අධිකාරි බලය නොලත් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | -------------------------------- | ----------- |
| (අ) | 2017 ජනවාරි 01 සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලයට අදාලව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව විශ්වවිද්‍යාල කාර්යය මණ්ඩලයේ 181 දෙනෙකු වෙනුවෙන් ගෙවල් කුලී දීමනා ලෙස එකතුව රු.69,239,305 ක් ගෙවා තිබුණි. | මෙම ගෙවීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ එකඟතාවය ලබා ගැනීමට දෙවන වරටත් යොමුකර ඇති අතර ඒ සඳහා අනුමැතිය මේ දක්වා ලැබී නොමැති බව | විධිමත් අනුමැතියකින් තොරව දීමනා ගෙවීමට කටයුතු නොකළ යුතුය. |
| (ආ) | 2015 වර්ෂයේ දී විශ්වවිද්‍යාලයේ අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවූ ඉංජිනේරු තනතුරක් සඳහා | 2016.12.30 දිනැති පත්වීම් ලිපිය අනුව එම මහතා රු. මිලියන 1,200 වටිනා ව්‍යාපෘති | අනුමත කාර්යය මණ්ඩලයට අයත් නොවන නිලධාරීන් |

| | | | |
|---|---|---|---|
| | 2015 දෙසැම්බර් 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි මාස 06 කාල පරිච්ඡේදයක් සඳහා රු.50,000 ක දීමනාවක් ගෙවීමේ පදනම මත ඌව පළාත් ගොඩනැගිලි අධ්‍යක්ෂ කාර්යාලයේ ප්‍රධාන ඉංජිනේරුවරයෙකු අර්ධ කාලීනව පත්කර තිබුණි. අඛණ්ඩව සේවා කාලය දීර්ඝ කරමින් 2018 ජුනි 01 දින සිට මාසික දීමනාව රු.75,000 ක් දක්වා වැඩි කර තිබු අතර 2015 දෙසැම්බර් සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය සඳහා එකතුව රු.5,325,000 ක මුදලක් ගෙවා තිබුණි. | 05 ක ටෙන්ඩර් කටයුතු හා ඉදිකිරීම් භාරව කටයුතු කරන ලද අතර ඔහුට ගෙවීම් සිදු කරනු ලබනුයේ අදාල ව්‍යාපෘති 05 හි උපදේශන සේවා සඳහා වෙන්කර ඇති මුල්‍ය ප්‍රතිපාදන වලින් බව. | බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සිදු කළ යුතුය. |
| (ඇ) | අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන තනතුරකට ඉඩම් පවරා ගැනීමේ කටයුතු අධීක්ෂණය සඳහා 2017 දෙසැම්බර් 06 දින සිට විශ්‍රාමික ඉඩම් කොමසාරිස්වරයකු බඳවාගෙන 2018 ජූලි 18 දිනැති අංක 3/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුකූල නොවන පරිදි මාසිකව රු.50,000 ක් බැගින් පත්වීම් දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා එකතුව රු.3,050,000 ක් ගෙවා තිබුණි. තවද, 2005 ජූලි 28 දිනැති අංක 1403/23 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ඉදිකිරීම සඳහා ඉඩම් අත්කරගනු ලබන බවට ප්‍රකාශ කිරීමෙන් පසු ඉදිරි කටයුතු ප්‍රාදේශීය ලේකම්වරයාට පැවරී තිබිය දී, උක්ත පත්වීම සිදුකර තිබුණු අතර පත්වීමෙන් පසු වසර 05 ක කාලයක් ගතවී තිබුණද ප්‍රකාශිත ඉඩම් විශ්වවිද්‍යාලයට පවරා ගැනීමට නොහැකි වී තිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කළ අංක UGC/ IDD/ GEN/ 01 දරන ලිපිය මඟින් ලබා දී ඇති නිර්දේශ අනුව විශේෂඥ දැනුම ඇති විශ්‍රාමික ඉඩම් කොමසාරිස්වරයකු විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය මත 2017 දෙසැම්බර් 11 වන දින පත් කර ගන්නා ලද බව<br>මෙම නිළධාරීයා පැමිණීමෙන් පසු හෙක්ටයාර 0.8119ක ඉඩම පැවරීමේ කටයුතු අවසන් කර ඇති අතර අක්කර 12ක හා අක්කර 05ක ඉඩම් පවරාගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව. | ඉහත පරිදි කටයුතු කඩිනම් කළ යුතුය. |
| (ඇ) | 2010 අප්‍රේල් 23 දිනැති අංක 921 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන | 178 වන පාලක සභා රැස්වීමේදී මෙම කරුණ | සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් බඳවා |

| | | |
|---|---|---|
| කොමිෂන් සභා චක්‍රලේඛයට අනුව ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති තනතුර සඳහා 2018 ජූලි 25 දිනැති පත්වීම් ලිපිය මගින් සුදුසුකම් සපුරා නොතිබුණු අයදුම්කරුවකු අවිධිමත් ලෙස බඳවාගෙන 2018 අගෝස්තු සිට 2022 දෙසැම්බර් 31 දක්වා එකතුව රු.14,061,053ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. එසේම පුහුණු තාක්ෂණික නිලධාරී II ශ්‍රේණියේ "ආ"කාණ්ඩයේ තනතුරකට සුදුසුකම් සපුරා නොමැති අයෙකු බඳවාගෙන 2016 අප්‍රේල් සිට 2021 ඔක්තෝම්බර් දක්වා රු.3,275,787 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | පිළිබඳව පත් කරන ලද අනු කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ සහ නිර්දේශ අනුව අධ්‍යාපන සුදුසුකම් සහ වසර හයක පළපුරුද්දක් අවශ්‍ය බැවින් 2018 අගෝස්තු 01 දින සිට වසර තුනක කාලයක් සහකාර පුස්තකාලයාධිපති (සංක්‍රාන්ති) තනතුරට ඇතුළත් කර 2021 අගෝස්තු 01 දින සිට බලපැවැත්වෙන පරිදි ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති තනතුරට උසස් කිරීමට පාලක සභාව තීරණය කරන ලද බව. | ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.8 අනුචිත ඇගයීම් හෝ ඇස්තමේන්තු කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආරක්ෂක සේවය පවත්වාගෙන යාම සඳහා අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු සමාගමේ ලංසුව සාධාරණ හේතු දැක්වීමකින් තොරව ප්‍රතික්ෂේප කර තෙවන අවම ලංසුකරු වෙත කොන්ත්‍රාත්තුව පිරිනැමීම හේතුවෙන් 2020 ඔක්තෝබර් 01 සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය සඳහා ආරක්ෂක සේවා ලබාගැනීම වෙනුවෙන් විශ්වවිද්‍යාලය විසින් රු.11,827,308 ක් වැඩිපුර ගෙවා තිබුණි. | දිනක අවම වැටුප අනුව නිවැරදිව ලංසුපත් ඉදිරිපත් කර ඇති ලංසුකරු වෙත ලංසුව ප්‍රදානය කර ඇති බව. | රජයට උපරිම වාසිදායක වන පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කළ යුතුය. |

## 02. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.225,687,938 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.142,962,594 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.368,650,532 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන රු.223,158,284 කින් අඩුවී තිබීම, මෙහෙයුම් වියදම් රු.256,952,249 කින් හා මෙහෙයුම් නොවන වියදම් රු.36,285,606 කින් වැඩිවී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**03. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | -------------------------------- | ----------- |
| (අ) | 2004 ඔක්තෝබර් 28 දිනැති අංක 2004/ED/HE/45 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අනුව විශ්වවිද්‍යාලය විසින් නේවාසිකාගාර ඉදිකර ශිෂ්‍යයන් හා නිලධාරීන්ට නේවාසික පහසුකම් සැපයිය යුතු වුවත්, ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර ගැනීමට හෝ සුදුසු ස්ථාන හඳුනා ගෙන නේවාසිකාගාර ඉදිකිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් 2018 ජනවාරි සිට 2022 දෙසැම්බර් දක්වා බාහිර නේවාසිකාගාර පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් එකතුව රු.202,907,314 ක් කුලී ගෙවීමට සිදුවී තිබුණි. | මූලික වශයෙන් සිසුන් 502 කට නේවාසිකාගාර පහසුකම් ඉදිකර ඇති අතර අනෙක් සිසුන් සඳහා විශ්වවිද්‍යාලය අවටින් නේවාසික පහසුකම් සපයා දී ඇති බව. නේවාසිකාගාර ඉදිකිරීමට 2015 වසරේ සිට කටයුතු කරන අතර ඒ වෙනුවෙන් අක්කර 12 ක ඉඩමක් පවරා ගැනීමට කටයුතු කරමින් පවතින අතර මෙමගින් 2000 කට පමණ නේවාසිකාගාර පහසුකම් ලබා දීමට අපේක්ෂා කරන බව. | සිසුන්ට නේවාසිකාගාර පහසුකම් සැලසීමට කඩිනම් පියවර ගත යුතුය. |